පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නැටුම්

සතිය- 6 වන සතිය

10 ශ්‍රේණිය

Prepared by- දෙහිඕවිට අධ්‍යාපන කලාපය

# නමස්කාර ගාථා සහ ටීකා සීපද ගායනය

- දහය ශ්‍රේණියේ පළමු වාරයේ දී ඔබ උගත් **"නමස්කාර ගාථා සහ ටීකා සීපද ගායනාවන්ගේ සමාජ සංස්කෘතික පසුබිම අධ්‍යයනය"** පාඩම ඇසුරෙන් පහත ක්‍රියාකාරකමෙ හි යෙදෙන්න.

01. නමස්කාර ගාථාවල සමාජ සංස්කෘතික පසුබිම විස්තර කරන්න.

02. නමස්කාර ගාථා ගායනයේ දී දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න.

03. ටීකා සීපද ගායනවල සමාජ සංස්කෘතික පසුබිම විස්තර කරන්න.

04. ටීකා සීපද ගායනවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න.

05. පහත සඳහන් කවි ගායනා හොඳින් අධ්‍යයනය කරන්න.

## නමස්කාර ගාථා

❖ සම්මා සම්බුද්ධ ඤාණේන - සම්මා සම්බුද්ධ දේසනා
සම්මා සම්බුද්ධ ලෝකස්මිං - සම්මා සම්බුද්ධ තේ නමෝ

❖ මේරුං විරාජිත සමං විය බුද්ධ රාජං
සිරි දන්ත සාගර සමං විය ධම්ම රාජං
සප්තකූට පබ්බත සමං විය සංඝ රාජං
සිරි බුද්ධ ධම්ම ගුණ සංඝ වරං නමාමි

ඉහත නමස්කාර ගාථාවෙහි දෙවන පාදයේ සිරි දනත් සහ තුන්වෙනි පාදයෙහි සප්තකූට යන්න නිවැරදි ය. ගායන ව්‍යවහාරයේ දී ශ්‍රී දන්ත හා සත්කුල යනුවෙන් භාවිත කෙරේ.

## ටීකා සීපද

❖ හෙමින් හෙමින් ................

තව ද .............ඌරන්ට, ගෝනුන්ට, මුවන්ට, සාවුන්ට වෙඩි තියන්න වල්පාරක් දිගේ කිට්ටු කරගෙන යන්නා වාගේ .............

හෙමින් හෙමින් මම ගේකට යන කලට ..............

එකෙක් ඇවිත් ..................

තව ද ............... අත්තා, මුත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තා, සෝලියා, පාඩියා කාලේ මහා උස් කණාටු පොල් ගහකින් ගෙඩි පනහක් හැටක් සිඳහෙළන්නා වාගේ .............

එකෙක් ඇවිත් දුන්නයි මගේ පිට මැදට ................

එගුටි කකා ................

තව ද ................ නැන්දා මාමාගේ ගෙදර ගොස් හොඳ හොද්දක් බතක් මාළුවක් පිත්තක් කෑවා වාගේ ................

එගුටි කකා මම පිට වී යන කලට .............

මම්ම මටම ................

තව ද ..................... නැන්දා මාමා ආච්චි ආතා හූරා නෑනා කෙනෙක් සමග සන්තෝස වේලාවක දී කොක් හඬලා සිනාසෙන්නා වාගේ ..........................

මම්ම මට ම ඉළ ඇට නැත හිනාවට ...................

❖ උන් තැන අටයි............

උන් තැන අටයි තරිකිට දොද්දොං තා

උන් තැන අටයි දිරිකිට දොද්දොං තා

උන් තැන අටයි දිත් තරිකිට දොං තා

තම් තම්දන තන දම්දන තනත්තනානා තම්දන

ඉහළ වෙලේ යන නෑනෝ පහළ වෙලේ යන නෑනෝ

ඉහළ වෙලේ ගොන් බානයි - පහළ වෙලේ තුන් බානයි

අල්ලපියෝ .................... අල්ලපියෝ ....................

තම්දන තම් දාන තානෙනා .................

උන් තැන අටයි සිටිතැන නවයයි පාද ....................

06. ඉහත සඳහන් කවි ගායනා කට පාඩම් කරන්න.

07. අන්තර්ජාලය භාවිතා කරමින් මෙම ගායනාවල හඬ පට හෝ වීඩියෝ දර්ශන රස විඳින්න.

08. එම හඬ පට හෝ වීඩියෝ දර්ශන අනුකරණය කරමින් නමස්කාර ගාථා සහ ටීකා සීපද ගායනයට යොමුවන්න.



ආර්.ඒ.මනුල රත්නායක
ගුරු උපදේශක